877
FACULTY OF GRADUATE STUDIES
RECEIVED
10 JUN 2014
UNIVERSITY OF KELANIYA

# කම්කරු පන්තියේ ඉල්ලීම් හා ජනමාධ්‍යය

## (පුවත්පත් මාධ්‍යයට විශේෂිතව)

MACO/M/15R/97
සුනිල් ජේ. දිසානායක
සමාජීය විද්‍යාපති (ජන සන්නිවේදන)
ජන සන්නිවේදන අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

ප්‍රවේශ අංකය: 877
වර්ග අංකය:

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ජන සන්නිවේදනය පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධි පාඨමාලාව සඳහා ඉදිරිපත් කරන ලදී.

2011 ජූලි

## නිබන්ධ සාරාංශය

කම්කරු පන්තිය රටක වැදගත් සමාජ ස්ථරයකි. එබැවින් එය නිර්මාණය වූ අන්දමත් එහි විකාශනයත් මෙරට කම්කරු පන්තිය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මෙම පර්යේෂණයේදී අධ්‍යයනය කර ඇත.

කම්කරු පන්තිය තම ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමටත්, පීඩිත පාලනයටත් එරෙහිව නිරන්තරයෙන් හඬ නගයි. ඊට මුහුණ දීමට සේව්‍ය පන්තිය ද සංවිධානය වී සිටී. කම්කරු පන්තිය ඉහළම ප්‍රතිලාභ ඉල්ලා සිටින අතර සේව්‍ය පන්තිය එය මගහැරීමට හැකි තරම් වෙර දරයි. ඒ අනුව මෙම දෙපාර්ශ්වය අන්ත දෙකක සිට කේවල් කරනු ලබයි. එබැවින් කම්කරු පන්තියේ ඉල්ලීම් හා එයට සේව්‍ය පන්තිය දැක්වූ ප්‍රතිචාර මෙහිදී හඳුනා ගැනීමට වෑයම් කළෙමි.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක කම්කරු පන්තියේ ඉල්ලීම් දිනාගැනීම පිණිස ජන මතය කොතරම් වැදගත් සාධකයක් වී තිබේද යන කරුණ මෙහිදී අධ්‍යයනයට බඳුන් විය. ඒ සඳහා ජනමාධ්‍යයෙන් ලැබෙන දායකත්වය ද විමසා බලන ලදී.

කම්කරු පන්තියේ ඉල්ලීම්වලට පක්ෂ ජන මතයක් අද සමාජය තුළ නොපවතී. මෙරට ප්‍රධාන ජනමාධ්‍යය ආයතනයන, ව්‍යාපාරිකයන් අතලොස්සක් හා රජය සතුව පැවතීම ඊට හේතුවයි. ඒ අනුව මෙම අධ්‍යයනය සඳහා පිහිටුවාගත් උපකල්පනය වන 'කම්කරු පන්තියට තම සන්නිවේදන අවශ්‍යතා සඳහා විකල්ප සන්නිවේදන මාධ්‍යයන් වෙත නැඹුරුවීමට සිදුව ඇත' යන කරුණ මෙම පර්යේෂණය මගින් තහවුරු වී ඇත.



**යොමු වචන** (Keywords):- කම්කරු පන්තිය හා සේව්‍ය පන්තිය, වෘත්තීය සමිති, කම්කරු පන්තියේ ඉල්ලීම් හා වෘත්තීය ක්‍රියාමාර්ග, ජන මතය, ජනමාධ්‍යයේ කාර්යභාරය, විකල්ප සන්නිවේදන මාධ්‍යයන්